**ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව - 2013**

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනතේ 18(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 අහිතකර මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

ප්‍රමිති අංක 02

සමාලෝචිත වර්ෂය තුළ මුදල් ගලා යාම් සහ ගලා ඒම් පිළිබිඹු වන පරිදි ප්‍රමිතයට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත දුර්වලතා නිරීක්ෂණය විය.

(i) පර්යේෂණ සඳහා භාණ්ඩාගාර ප්‍රදාන ලෙස සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු රු.16,323,030 ක් හා වර්ෂය තුළ දරන ලද වියදම් රු.7,006,672 ක් මුදල් ලැබීම් හා ගෙවීම් ලෙස වෙන් වෙන්ව හඳුනා නොගෙන ශුද්ධ ප්‍රතිඵලය දක්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර වත්කම් ඉවත් කිරීමෙන් ලාභය හා ඒ සඳහා ලද මුදල් සැලකිල්ලට නොගෙන ශුද්ධ ප්‍රතිඵලය දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා පාරිතෝෂික වෙන්කිරීම් රු.157,741 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ඉකුත් කාල පරිච්ඡේදවලට අදාළ ප්‍රාග්ධන ප්‍රදාන හා ස්ථාවර වත්කම් සම්බන්ධව හඳුනාගත් වැරදි නිවැරදි කිරීම් සමාලෝචිත වර්ෂය තුළ සිදුකර තිබූ නමුත් වැරදි ගණනය කිරීම් හේතුවෙන් තවදුරටත් සහා අරමුදල් ගිණුම, තැගි ගිණුම හා සමුච්චිත ඌනතාවය පිළිවලින් රු.9,928,638ක්, රු.541,785ක් හා රු.4,909,826ක් වැඩියෙන්ද භාණ්ඩාගාර පර්යේෂණ ප්‍රදාන ගිණුම රු.5,560,597 ක් අඩුවෙන්ද දක්වා තිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

තරඟකාරී ගිවිසුම් පර්යේෂණ වැඩසටහන 2010 දෙසැම්බර් 31 දින අවසන් වී තිබුණ ද, මේ සඳහා ලබාදී තිබුණු අත්තිකාරම් වලින් රු.659,131 ක් 2013 දෙසැම්බර් 31 දින දක්වාම පියවා නොතිබුණි.

2.4 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනත | |
| (i) 4(1) වගන්තිය | සභාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් ගණන 14 ක් විය යුතු වුවද 2013 දෙසැම්බර් 31 දිනට එහි සාමාජික සංඛ්‍යාව 12 ක් විය. |
| (ii) 4.1(අ) වගන්තිය | කෘෂිකාර්මික පර්යේෂණ විෂයය හෝ කෘෂිකාර්මික පර්යේෂණයට සම්බන්ධ යම් විෂයයක් හෝ භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා සභාවේ සාමාජිකයකු ලෙස පත්කළ යුතු වුවත්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සභාවේ සාමාජිකයකු ලෙස පත්කර තිබුණි. |
| (iii) 4(1) (ඇ) හා (ක) වගන්ති | ස්ථිර භෝගවලට සම්බන්ධ කෘෂිකාර්මික පර්යේෂණ ආයතනයක අධ්‍යක්ෂවරයෙක් වන තැනැත්තෙක් හෝ එවැනි ආයතනයක කෘෂිකාර්මික පර්යේෂණ පිළිබඳ වගකීම දරන තැනැත්තෙක් සහ සභාවේ නිර්දේශ සහිතව විද්‍යාත්මක පර්යේෂණයෙහි හා කළමනාකරණයෙහි විශිෂ්ඨත්වයට පත් තැනැත්තෙක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලෙස පත් කලයුතු නමුත් එයට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (iv) 7(4) වගන්තිය | සභාපතිවරයාගේ ධූර කාලය වසර 03 ක් විය යුතු නමුත් 2010 මැයි 12 දින පත්කර තිබූ සභාපතිවරයාගේ පත්වීම් ලිපියේ ධූර කාලය නිශ්චිතව සඳහන් කර නොතිබුණි. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 771 | සමාලෝචිත වර්ෂයේදී ප්‍රයෝජනයට ගත නොහැකි ලෙස හඳුනාගෙන තිබුණු, ගත් මිළ රු.733,564 ක් වූ පරිගණක, කාර්යාල ලී බඩු, කාර්යාල උපකරණ, ලිපිද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය තොගයක් රෙගුලාසි ප්‍රකාර කටයුතු කිරීමකින් තොරව පොත්වලින් ඉවත්කර තිබුණි. |

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,909,295 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.7,285,498 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ

ඌනතාවය රු.3,376,203 කින් අඩුවී තිබුණි. රාජ්‍ය ප්‍රදාන හා අනෙකුත් ආදායම් රු.4,797,247 කින් හා රජයේ ප්‍රදාන සඳහා ක්‍රමක්ෂය රු.3,053,942 කින් වැඩිවීම හා පරිපාලන හා මූල්‍ය වියදම් රු.3,864,010 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාව විසින් කමිටු 13 ක් පිහිටුවා තිබුණුනත් පෙර වර්ෂවලට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පර්යේෂණ ක්‍රියාත්මකවීමේ පැහැදිලි අඩුවීමක් නිරීක්ෂණය විය. විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු කමිටු 11 කට අදාළ විස්තර පහත දැක්වේ.

(i) පසුගිය වසර තුන තුළදී ඉදිරිපත්ව තිබුණු පර්යේෂණ යෝජනා අතුරින් පර්යේෂණ 172 කට අනුමැතිය ලබාදී තිබුණද පර්යේෂණ 72 ක කටයුතු පමණක් අවසන් කර තිබුණි. එයින්ද අවසන් වාර්තා ඉදිරිපත් කර තිබුණේ පර්යේෂණ 24 ක පමණි.

(ii) 2012 හා 2013 වර්ෂවලදී හෙක්ටර් කොබ්බෑකඩුව කෘෂිකර්ම පර්යේෂණ හා පුහුණු ආයතනයට ලබාදී තිබුණු රු.1,197,979 ක් වූ පර්යේෂණ ව්‍යාපෘති 32 කට අදාළ අවසන් වාර්තා (Terminal Report) 2014 දෙසැම්බර් 31 දක්වාම සභාවට ලැබී නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් පසු විපරම් කිරීමක් ද සිදුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සභාවේ ප්‍රධාන කාර්යයන් 13 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර රු.20,200,000 ක් වෙන්කර තිබුණද, වැය කළ මුදල රු.6,367,245 ක් විය. ඉන් කාර්යය 03 ක මූල්‍ය ප්‍රගතිය සියයට 50 ඉක්මවා තිබුණු අතර කාර්යයන් 08 ක ප්‍රගතිය සියයට 30 කට වඩා අඩු මට්ටමක පැවතිණි.

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

වර්ෂ 03 කට අදාළ කෘෂිකර්ම පර්යේෂකයන් පිළිබඳ තොරතුරු ඇතුළත් පොතෙන් පිටපත් 1,500 ක් හා අනෙකුත් පර්යේෂණ පිළිබඳ පොත් වලින් පිටපත් 5,500 ක් මුද්‍රණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,943,500 ක් වැයකර තිබුණු අතර 2014 මාර්තු 21 දින වන විටත් ඉන් රු.1,054,495 ක් වටිනා පොත් 4,721 ක් බෙදා හැර නොතිබුණි. පොත් විශාල ප්‍රමාණයක් මුද්‍රණය කිරීම සඳහා වූ අවශ්‍යතාවය හා ඒ සඳහා වූ අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවිය.

**4.3 ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීම**

කෘෂිකාර්මික විද්‍යා සහ තාක්ෂණික ඇගයීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබුණු ප්‍රතිපාදන ඉක්මවා රු.46,217 ක් වැය කර තිබුණි.

**4.4 හඳුනාගන්නා ලද පාඩු**

සභාව විසින් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල් නියමිත පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේදි අධිභාර වශයෙන් රු.29,056 ක් ගෙවා තිබුණි.

**4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සභාවේ සම්පත්**

සභාව සතු රු.6,203,000 ක් වටිනා කැබ් රථයක් රේඛීය අමාත්‍යාංශයේ ප්‍රයෝජනය සඳහා සමාලෝචිත වර්ෂයේදී මුදාහැර තිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

අනුමත කාර්ය මණ්ඩලය 31 වුවද 2013 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 28 ක් වූයෙන් මාණ්ඩලික තනතුරු 02 ක් හා කණිෂ්ඨ තනතුරු 01 ක් පුරප්පාඩුව පැවතුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2013 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 22 දින විගණනය සඳහා ඉදිරිපත්කර තිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල වූ වැරදි හා අඩුපාඩු නිවැරදි කිරීම සඳහා 2014 ජූනි 16 දින ඒවා ආපසු ලබාගෙන තිබුණි. සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2014 දෙසැම්බර් 16 දින විගණනය සඳහා නැවත ඉදිරිපත් කර තිබුණි.

**5.2 අයවැය පාලනය**

අයවැය ලේඛනය හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 22 සිට සියයට 68 අතර විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**5.3 ප්‍රසම්පාදන සැලැස්ම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආරක්ෂක තාප්පයක්, මාර්ගයක් හා කානු පද්ධතියක්, නාම පුවරුවක් සහ ප්‍රධාන ගේට්ටුවක් ඉදිකිරීම සමාලෝචිත වර්ෂයේ වැඩ සැලැස්මට ඇතුළත් කර තිබුණද එම කාර්යයන් 2013 වර්ෂයට පෙර නිම කළ කාර්යයන් විය.

(ආ) ප්‍රසම්පාදන සැලසුමෙහි ගිණුම්කරණ මෘදුකාංගයක් පිළියෙල කිරීම සැලසුම්කර තිබුණ ද වර්ෂය තුළදී එම කාර්යයන් ඉටුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොවූ කාර්යයන් 04 ක් සඳහා රු. 1,621,350 ක් වැයකර තිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) පර්යේෂණ වියදම්
(ආ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඈ) වාහන පරිපාලනය
(ඉ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය